# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2198/57 - 2020 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2020.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2019 දෙසැම්බර් මස 05 දිනැති 2152/32 දරන ගැසට් නිවේදනයේ 2 වන ඡේදයේ (ක) උපඡේදයට වහාම පහතින් පහත උපඡේදය එකතු කිරීමෙන් සංශෝධනය කරමි.

"(ඛ) ඖෂධ නිෂ්පාදන, සැපයීම සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඖෂධ නිෂ්පාදකයින් විසින් ආනයනය කරනු ලබන ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිතා වන යන්ත්‍රෝපකරණ, උපාංග සහ ඒවායේ අමතර කොටස්."

මෙම නියෝගය 2020 ඔක්තෝබර් මස 24 වැනි දින සිට බලපැවැත්වේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

12 - 28

1A - PG 5220 — 575 (2020/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*